28-11-2016

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

# 2018 A/L ව්‍යාපාර අධ්‍යයනය Business Studies II

Grade - 12

Learning Resource Center
De Mazenod College
Kandana

සැලකිය යුතුයි.

- ප්‍රශ්න පත්‍රයේ මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.
- ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

01 (i) උසස් පෙළින් පසු ඊළඟට කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳව කථා කරමින් සිටි සිසුන් කිහිප දෙනෙකු දැක්වූ අදහස් මෙසේ ය.

ගිහාන් මම පොඩි බිස්නස් එකක් පටන් ගන්නයි හිතන්නේ.

ටිකිරි මම නම් පාර්ට් ටයිම් ජොබ් එකක් හොයා ගන්න බලනවා

බොනි වෘත්තිකයෙක් වීම මගේ සිහිනයක් නිසා ඊට අවශ්‍ය පාඨමාලාවකට යොමු වීම තමයි. කරන්නේ ව්‍යාපාරයක් පටන් ගන්න එක හිතන තරම් ලේසි වැඩක් නෙවෙයි. බඩු හදන්න විතරක් නෙමෙයිනේ කරන්න වැඩ රාශියක් තියනවා නේ

අ) ගිහාන් විසින් ව්‍යාපාරයක් පටන් ගැන්මට පෙර සැලකිල්ලට ගත යුතු මූලික සාධක හතරක් නම් කරන්න.

ආ) භාණ්ඩ නිෂ්පාදනයට අමතරව ව්‍යාපාරයක් තුළ සිදුවන කටයුතු කවරේද?

ඉ) ටිකිරි හා බොනි මෙන් බොහෝ පුද්ගලයන් ව්‍යාපාරිකයන් වීම වෙනුවට රැකියාවක හෝ වෘත්තියක නියැලීමට උත්සහ දරන්නේ ඇයි?

(ii) විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු වන රුක්ෂාන් තම අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය අතිරේක අරමුදල් ඉපැයීමේ අරමුණු ද සහිතව ඉංග්‍රිසි භාෂාව ඉගැන්වීමේ උපකාරක පංතියක් තම නිවසේ පවත්වාගෙන යන අතරම එම උපකාරක පාඩම් මාලාව අන්තර්ජාලය ඔස්සේ ද විකාශනය කරයි.

අ) මෙම සිද්ධියේ සඳහන් අවස්ථාව ව්‍යාපාරයක් ලෙස සැලකිය හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

ආ) රුක්ෂාන් කුමන වෙළෙඳපොළ තත්ත්ව යටතේ සිය සේවාව සැපයීම සිදු කරන්නේද? පැහැදිලි කරන්න.

(iii)අ) කාර්මික විප්ලවය හේතු කොට ගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයට ඇති කළ හිතකර හා අහිතකර බලපෑම් දෙක බැගින් සඳහන් කරන්න.

ආ) "ව්‍යාපාර විකාශනයේ දී කාර්මික විප්ලවයෙන් සිදු වූ බලපෑම් සුළු පටු නොවේ."
කාර්මික විප්ලවය නිෂ්පාදනය, වෙළෙඳාමට හා සමාජයට බලපෑම් කළ ආකාර වෙන වෙන ම පැහැදිලි කරන්න.

(iv)ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශය තුළ සේවා සපයන ආයතන බහුලව දක්නට ලැබේ.

අ) ව්‍යාපාර සඳහා සහාය වන උපකාරක සේවා හතරක් කෙටියෙන් විස්තර කරන්න.

ආ) ශ්‍රී ලංකාව ආනයනය කරන හා අපනායනය කරන ප්‍රධාන සේවා දෙක බැගින් සඳහන් කරන්න.

(v) අ) පහත දැක්වෙන්නේ නිෂ්පාදනයේ විවිධ අංශ අඩංගු ලැයිස්තුවකි.

| | | |
|---|---|---|
| - කෘෂි | - දැව හා වන | - ධීවර |
| - පතල් හා කැනීම් | - නිෂ්පාදන කර්මාන්ත | - ඉදිකිරීම් |
| - ප්‍රවාහනය | - සන්නිවේදනය | - බැංකු |
| - රක්ෂණය | - තොග හා සිල්ලර වෙළෙඳාම | |

මේවා පහත දැක්වෙන ආකාර දෙක යටතේ වර්ග කර දක්වන්න.

- ප්‍රාථමික, ද්විතියික හා තෘතියික වශයෙන්
- කෘෂි, කාර්මික හා සේවා වශයෙන්

ආ) පහත සඳහන් පද පැහැදිලි කරන්න.

– කාර්මික භාණ්ඩ
– පාරිභෝගික භාණ්ඩ

(ලකුණු 04 x 05 = 20 යි.)

02 (i) අ) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය සම්පත් වර්ග මොනවාද?

ආ) පහත දැක්වෙන සංකල්ප යුගල කෙටියෙන් පැහැදිලි කරන්න.

– ප්‍රාථමික කර්මාන්ත, ද්විතියික කර්මාන්ත
– අරමුණු, පරමාර්ථ

(ii) අ) භාණ්ඩ හුවමාරුව යනු කුමක්ද?

ආ) වුවමනා පිළිබඳ ද්විත්ව සමපාතයක් යන්නෙන් කවරක් අදහස් වේද?

ඉ) ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා ඔබ පෙළ ගස්වන්නේ කෙසේද?

(iii) දිනිති තමා විසින් ම සෞඛ්‍යාරක්ෂිත ලෙස සකස් කරනු ලබන ඉදිආප්ප, පිට්ටු, රොටි සහ බත් උදැසන ආහාර ලෙස සකස් කර තම දරුවන්ට ද ලබා දී ඇයගේම ව්‍යාපාරයේ තබා අලෙවි කරයි.

අ) දිනිතිගේ ව්‍යාපාරය විසින් සපයනු ලබන ඉදිආප්ප, පිට්ටු රොටි සහ බත් යනාදිය ව්‍යාපාර සංකල්ප අතුරින් කවරක් නියෝජනය කරයි ද?

ආ) දිනිතිගේ ව්‍යාපාරය නිදසුනට ගනිමින් ඍජු නිෂ්පාදනය සහ වක්‍ර නිෂ්පාදනය යන සංකල්ප පැහැදිලි කරන්න.

(iv) අ) "වාණිජ්‍යය යන පදය ව්‍යාපාර යන පදයට සම කළ නොහැක." පැහැදිලි කරන්න.

ආ) නූතන ලෝකයේ වාණිජ කටයුතුවල වේගවත් ප්‍රසාරනයට තුඩු දුන් හේතු හතරක් සඳහන් කරන්න.

(v) අ) "වර්තමානයේ විද්‍යුත් වාණිජ්‍යය ලෝක වෙළෙඳාමෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් අත්කර ගනිමින් සිටී" ඒ අනුව ව්‍යාපාරයකට විද්‍යුත් වාණිජ්‍යය හරහා අත්කර ගත හැකි ප්‍රතිලාභ හා සීමාකම් කවරේද ?

ආ) වෙළෙඳපොළින් පාරිභෝගිකයා මිලදී ගනු ලබන්නේ භාණ්ඩ හා සේවා පමණක් නොවේ. ඊට අමතරව වෙළෙඳපොළෙන් පාරිභෝගිකයා මිලදී ගනු ලබන අයිතම හතරක් නම් කරන්න.

(ලකුණු 04 x 05 = 20 යි.)

03 (i) අ) ව්‍යාපාර පරිසරය මූලික වශයෙන් අභ්‍යන්තර හා බාහිර වශයෙන් වර්ග කෙරේ. එම වර්ගීකරණය උප කොටස් සහිතව විස්තරාත්මක ගැලීම් සටහනක් මගින් ඉදිරිපත් කරන්න.

(ආ) ව්‍යාපාර ආයතනයක අභ්‍යන්තර පරිසරයෙහි පැන නැගිය හැකි ශක්තීන් හා දුර්වලතාවලටත් බාහිර පරිසරයේ පැන නැගිය හැකි අවස්ථා හා තර්ජනවලටත් නිදසුන් දෙක බැගින් සපයන්න.

(ii) අ) වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ බලපෑම් කරන කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වය වර්ධනය වෙමින් පවතී. "බලපෑම් කරන කණ්ඩායමක්" යනු කුමක්ද? එම කණ්ඩායම් ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපෑම් කරන ආකාරය පැහැදිලි කරන්න.

ආ) මෑත කාලයේ ලෝකයේ බොහෝ රටවල සාර්ව පරිසරය තුළ දේශගුණික විපර්යාසයන් රාශියක් වාර්තා විය. මිනිසා විසින් සිදුකළ ඉවක් බවක් නැති පරිසර දූෂණය මීට හේතු විය. පරිසර දූෂණය අවම කිරීමට ලෝක ප්‍රජාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේදැයි පැහැදිලි කරන්න.

(iii) අ) ව්‍යාපාර සාර්ව පරිසර බලවේග අතර අන්තර් රැඳියාවක් පවතින බව නිදසුන් දෙකක් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න.

ආ) ව්‍යාපාර ආසන්න පරිසර බලවේග ව්‍යාපාරයට යහපත් බලපෑම් ඇතිකරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) අ) ව්‍යාපාර පරිසරයේ ඇතිවන වෙනස්කම් පිළිබඳ ව්‍යාපාරිකයන් නිරන්තර අවධියෙන් සිටිය යුත්තේ ඇයි? පැහැදිලි කරන්න.

ආ) ව්‍යාපාර කෙරෙහි බලපාන ආර්ථික පරිසර සාධක තුනක් සහ ප්‍රජා පරිසර සාධක තුනක් සඳහන් කරන්න.

(v) ලෝක ජනගහනය වියපත් වෙමින් පවතී. වර්ෂ 2050 වන විට ජනගහනයෙන් තුනෙන් එකක් වයස අවුරුදු 60 ක් ඉක්ම වූ පුද්ගලයන් බවට පුරෝකථනය කර තිබේ.

අ) වැඩිහිටි ජනගහනය වර්ධනය වීමට අමතරව ප්‍රජා පරිසරයේ කැපී පෙනෙන ප්‍රවණතා හතරක් නම් කරන්න.

ආ) ජනගහනය වියපත් වීම තුළින් ව්‍යාපාර ආයතනයකට උදාවන අවස්ථා හා තර්ජන දෙක බැගින් නම් කරන්න.

(ලකුණු 04 x 05 = 20 යි.)

04 (i) අ) සමාජ වගකීම් (Social Responsibility) යනු කුමක් දැයි පැහැදිලි කර, ව්‍යාපාරයකට ප්‍රජාව සම්බන්ධයෙන් ඇති සමාජ වගකීම් තුනක් සඳහන් කරන්න.

ආ) ව්‍යාපාර ආචාරධර්ම යනුවෙන් අදහස් කරන්නනේ කුමක්ද?

(ii) අ) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම ව්‍යාපාර වලට වැදගත් වන්නේ කෙසේද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

ආ) පහත සඳහන් ව්‍යාපාර ආචාරධර්ම පැහැදිලි කරන්න.

- සත්‍ය දැ සන්නිවේදනය කිරිම.
- අන් අයට හානි නොකිරිම.

(iii) ඔබ දන්නා ව්‍යාපාර ආයතනයක් නම් කර එම ව්‍යාපාර ආයතනය සමාජ වගකීම් ඉටු කිරිමට කෙසේ දායක වන්නේ දැයි පැහැදිලි කරන්න.

(iv) වර්තමානයේ සමහර ව්‍යාපාර කොටස්කරු සංකල්පයෙන් ඉවත් වී ඇල්මැති පාර්ශ්ව සංකල්පයට අවතීර්ණ වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(v) අ) ව්‍යාපාර සමාජ වගකීම් ඉටුකිරිම තුළින් ව්‍යාපාරිකයන් ලබන ප්‍රතිලාභ මොනවාද?

ආ) ආචාරධර්ම පද්ධතියක් යනු කුමක්දැයි පැහැදිලි කර ආචාරධර්ම පද්ධතියක් පිළියෙල කිරිමේදි සැලකිලිමත් විය යුතු සාධක මොනවාද?

(ලකුණු 04 x 05 = 20 යි.)

[පස්වන පිටුව බලන්න.]

Learning Resource Centre
R
De Mazenod College



05 (i) රජය ව්‍යාපාර කටයුතුවලට මැදිහත් නොවීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිවිපාක හතරක් පැහැදිලි කරන්න.

(ii) රජය හා ව්‍යාපාර අතර යහපත් අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇතිවීමට නම් රජය විසින් ව්‍යාපාරවලට අවශ්‍ය පහසුකම් සැපයිය යුතු අතර ව්‍යාපාර ද රජයේ අරමුණු ඉටු කිරීමට දායක විය යුතුය. ව්‍යාපාර රජයේ අරමුණු ඉටු කිරීමට දායක වන අකාර හතරක් පැහැදිලි කරන්න.

(iii) පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරන උපකරණ දෙකකි.

– පොළී අනුපාතිකය

– ව්චල්‍ය සංචිත අනුපාතිකය

මෙම උපකරණ ක්‍රියාත්මක කිරීම නිසා ව්‍යාපාරවලට කුමන ආකාරයක බලපෑම් ඇති කරන්නේ දැයි වෙන් වෙන්ව පැහැදිලි කරන්න.

(iv) පහත සඳහන් වන්නේ රජයක ආර්ථික අරමුණු ඉටුකර ගැනීමේදි යොදා ගන්නා සංකල්ප කිහිපයකි. එමගින් අපේක්ෂිත දෑ වෙන් වෙන්ව පැහැදිලි කරන්න.

– ආර්ථික කාර්යක්ෂමතාවය

– පූර්ණ සේවා නියුක්තිය

– ආර්ථික වෘද්ධිය

– ආර්ථික නිදහස

(v) අ) පාරිභෝගික ජාත්‍යන්තරය ප්‍රකාශ කළ පාරිභෝගික අයිතිවාසිකම් හතර සඳහන් කරන්න.

ආ) වර්තමාන වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයාට විවිධ වූ අසාධාරණ වෙළෙඳ පිළිවෙත් හා අනතුරුදායක තත්වයන්ට මුහුණ දීමට සිදු වී ඇත. මේ නිසා ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධව ක්‍රියා කිරීමට රජය විසින් පනවා තිබෙන ප්‍රධාන නීතිය කුමක්ද?

(ලකුණු 04 x 05 = 20 යි.)

06 (i) අ) ටෙඩි කිසි දිනෙක අන් අය සමඟ කරනු ලබන කටයුතු පිළිබඳ ව විශ්වාසය නොකබන අතර ස්වාධීනව කටයුතු කිරීමට කැමති අයෙකු වේ. නීල් සහයෝගයෙන් කටයුතු කරමින් අන් අයගේ අදහස් පිළිගැනීමට කැමති අයෙකි. ටෙඩි හා නීල්ට ආරම්භ කිරීමට යෝග්‍ය ව්‍යාපාර සංවිධාන වර්ග වෙන වෙනම ලියන්න.

ආ) මෙතෙක් තනි වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය තරිඳු ඔහුගේ මිතුරකු වූ කුමාර සමඟ සම්බන්ධ වී හවුල් ව්‍යාපාරයක් පිහිටුවා ගත්තේ ය. මෙම තීරණයේ වාසි හා අවාසි දෙක බැගින් දක්වන්න.

**(ii)** සුදුනි, ලක්ෂි, නෙත්සරණි යන තිදෙනා පිළිවෙලින් රු 30,000 රු 60,000 සහ රු 90,000 බැගින් ප්‍රාග්ධනය යොදා හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම හවුල්කාරිනියන් අතර විශේෂයෙන් අත්සන් තබන ලද හවුල් ගිවිසුමක් නොවීය.

අ) වර්ෂය තුළ රු 90,000 ක ලාභයක් ඉපැයුවේ නම් ඒ ඒ හවුල්කාරිනියන්ට ලැබිය යුතු ලාභ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් දක්වන්න.

ආ) මෙම හවුල්කාරිනියන් සතු අයිතිවාසිකම් සහ යුතුකම් දෙක බැගින් ලියන්න.

**(iii)** අ) සෙසු ව්‍යාපාර සංවිධාන හා සසඳන කල කේවල ස්වාමි ව්‍යාපාර වල දැකිය හැකි විශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

ආ) ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි විවිධ පදනම් දෙකක් නම් කරන්න.

**(iv)** අ) හවුල් ව්‍යාපාරයක් යනු කුමක් ද? හවුල් ව්‍යාපාරයක් පැවතීමට අවශ්‍යයෙන්ම තිබිය යුතු අංග ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

ආ) හවුල් ගිවිසුමක් යනු කුමක් ද? හවුල් ව්‍යාපාරයට ලිඛිත හවුල් ගිවිසුමක ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

**(v)** ආතර්, බර්ටි, චාල්ස් ගිණුම්කරණය හා බදු සේවා සැපයීමේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ගණකාධිකාරින් තිදෙනෙකි. ගිණුම්කරණය හා බදු සේවාවන් හි වෙන් වෙන් වූ අංශ පිළිබඳ විශේෂඥතා ඔහුන් සතු වූහ. ආරම්භක ප්‍රාග්ධනය සම සමව සැපයූ අතර ලේකම්වරියක් හා ලිපිකරුවන් කිහිප දෙනෙක් ඔහුන් යටතේ සේවය කළහ. ඉතා සාර්ථකව ව්‍යාපාරය පවත්වාගෙන ගිය ද, ටික කලකින් ඔහුන් අතර ඇති වූ මතභේදයක් නිසා බර්ටි හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වීමට තීරණය කළේය. ඒ අනුව හවුල විසුරුවාලීමට තීරණය කෙරිණි. එහෙත් ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් කෙසේ බෙදාගන්නවා ද යන්න ඔහුනට ගැටලුවක් විය.

අ) මෙම සිද්ධියේ සඳහන් වන පරිදි බොහෝමයක් හවුල් ව්‍යාපාර සේවා සැපයීමේ කටයුතුවල නිරත වේ. හවුල් ව්‍යාපාර එසේ සේවා සැපයුම් අංශයේ නිරතවන්නේ ඇයි දැයි පෙන්වා දෙන්න.

ආ) මොහුන්ගේ හවුල් ව්‍යාපාරය මේ අයුරින් අසාර්ථක වීම වලක්වා ගැනීමට ව්‍යාපාරය ආරම්භයේ දී ම කුමක් කළ යුතුව තිබුණේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04 x 05 = 20 යි.)

**07** **(i)** අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ආරම්භ කළ හැකි සමාගම් වර්ග ගැළීම් සටහනක් මගින් ඉදිරිපත් කරන්න.

ආ) සීමාසහිත පෞද්ගලික සමාගමක් හා සීමාසහිත පොදු සමාගමක් අතර සැසඳීමක් කරන්න.

**(ii)** අ) සීමිත පොදු සමාගමක සාමාන්‍ය කොටස්කරුවකු සතු අයිතිවාසිකම් හා යුතුකම් කවරේ ද ?

ආ) කොටස් බලපත්‍රය (Share Warrant) හා කොටස් සහතිකය (Share Certificate) පැහැදිලි කරන්න.

(iii) අ) කොටස් හා ණයකර අතර ඇති වෙනස්කම් මොනවාද ?

ආ) "සෑම සීමාසහිත පොදු සමාගමක් ම නිලලැයිස්තුගත සමාගමක් වේ." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න.

(iv) අ) සංස්ථාපිත සමාගමක් විසින් පවත්වනු ලබන ප්‍රධාන රැස්වීම් වර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

ආ) පෙරකලාසිකරු හා පෙරකලාසි පත්‍රය යන්න හඳුන්වන්න.

(v) අ) සංස්ථාපිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලියවිලි නම් කරන්න.

ආ) පැහැදිලි කරන්න

- සංස්ථා ප්‍රකාශය
- සංස්ථාපන සහතිකය

Learning Resource Center R De Mazenod College Kandana

(ලකුණු 04 x 05 = 20 යි.)

08 (i) අ) කොටස් වෙළෙඳපොළෙන් සමාගම්වලට නව ප්‍රාග්ධනයක් සම්පාදනය නොකරයි. මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ආ) සාමාන්‍ය කොටස් සහ වරණීය කොටස් අතර පවත්නා වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) අ) වරලත් ව්‍යාපාර ක්‍රමයෙන් වරලත්ලාභියාට හා වරලත්හිමියාට අත්වන වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න.

ආ) වරලත්ලාභියාට වරලත්හිමියා විසින් ලබාදෙන සේවා පහසුකම් හතරක් ලියන්න.

(iii) අ) බහු ජාතික සමාගමක් යනු කුමක්ද?

ආ) බහු ජාතික සමාගම් ක්‍රමයේ හිතකර හා අහිතකර ලක්ෂණ ලියන්න.

(iv) අ) අක්වෙරළ සමාගම් සහ නිර්නේවාසික සමාගම් කෙටියෙන් පැහැදිලි කරන්න.

ආ) ප්‍රධාන වරලත් ව්‍යාපාර වර්ග නම් කරන්න.

(v) අ) ඇපයෙන් සීමිත සමාගම් යන්න හඳුන්වා ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණ ලියන්න.

ආ) පැහැදිලි කරන්න.

- සිරස් සංයෝජන
- තිරස් සංයෝජන
- විෂම සංයෝජන

(ලකුණු 04 x 05 = 20 යි.)

*******